ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# AA2 විභාගය - 2018 ජනවාරි

# ප්‍රශ්න සහ යෝජිත උත්තර
# විෂය අංක (AA25)

## ව්‍යාපාර නීතිය සහ ආචාරධර්ම
## (BLE)


ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන : 011-2-559 669

මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි.

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශය

# AA2 විභාගය - 2018 ජනවාරි
# (AA25) ව්‍යාපාර නීතිය සහ ආචාරධර්ම

# යෝජිත උත්තර

## A කොටස

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**

අනිවාර්ය ප්‍රශ්න දහයකි. (10)

(මුළු ලකුණු 20)

## 1 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| ප්‍රශ්නය | උත්තරය |
|---|---|
| 1.1 | (3) |
| 1.2 | (1) |
| 1.3 | (2) |
| 1.4 | (4) |
| 1.5 | (4) |
| 1.6 | (3) |
| 1.7 | (3) |

1.8
තේසවලමෙයි නීතිය
උඩරට නීතිය
මුස්ලිම් නීතිය

1.9
- සුරකුම් වෙළඳපොළෙහි සංවර්ධනය පිළිබඳ රජයට උපදෙස් ලබාදීම.
- බලපත්‍රලාභී කොටස් වෙළඳපොළ තුළ සුරකුම්පත් පිළිබඳ කරුණු හා ලැයිස්තුගත කිරීම් නියාමනය කිරීම.
- ලැයිස්තුගත කිරීමක් සඳහා ඉදිරිපත් කරන යම්කිසි අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට බලපත්‍රලාභී කොටස් වෙළඳපොළ අධීක්ෂණය කිරීම
- බලපත්‍රලාභී කොටස් වෙළඳපොළ බ්‍රෝකර්වරුන්ගේ, අලෙවි නියෝජිතන්ගේ, සමාගම් හා ඒකකභාර වල භාරකරුවකුගේ, ලැයිස්තුගත පොදු සමාගමක, ලියපදිංචි වෙළඳපොළ අතරමැදියන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ විභාග කිරීම හා පරීක්ෂා කිරීම.
- සුරකුම්පත් වෙළඳපොළ සම්බන්ධව රාජ්‍ය වැඩසටහන් හා ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම.

1.10
- පාරිභෝගිකයන්ගේ ජීවිතවලට සහ දේපළවලට හානිවන පරිදි සිදුවන භාණ්ඩ හෝ සේවා ප්‍රවර්ධනයෙන් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම
- අසාධාරණ වෙළෙඳ පරිචයන්ගෙන් පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සහ පාරිභෝගික අවශ්‍යතා වෙනුවෙන් නිසි අවධානය ලබාදීම
- තරගකාරී මිල ගණන් යටතේ පාරිභෝගිකයන්ට භාණ්ඩ හා සේවා ලබාගැනීම සඳහා ප්‍රමාණවත් ප්‍රවේශවීමේ මාර්ගයන් පවතින බවට සහතික කිරීම
- අසාධාරණ වෙළෙඳ පරිචයන්ට එරෙහිව, තහනම් කරන ලද වෙළෙඳ පරිචයන්ට එරෙහිව හෝ පාරිභෝගිකයා සූරාකෑමට ලක් කරන ඕනෑම වෙළෙඳ පරිචයකට එරෙහිව කටයුතු කර අලාභ / හානි අය කරගැනීම

***(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 20)***

***A* කොටසෙහි අවසානය.**

aat SRI LANKA

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

## 2 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

සිරිපාල සහ දුමින්ද අතර විස්තරයට අනුව භාණ්ඩ විකිණීම සඳහා ගිවිසුමක් ඇති කරගෙන ඇත.

විස්තරයට අනුව භාණ්ඩ විකිණීම සඳහා ගිවිසුමක් ඇති වන අවස්ථාවක අදාළ භාණ්ඩ විස්තරයට අනුකූල විය යුතු බවට වන ව්‍යංග කොන්දේසියක් භාණ්ඩ විකිණීමේ ආඥාපනතේ දැක්වේ.

- *Beal Vs. Taylor*
- *Moore and Landauer (1921)*
- *Harrison Vs. Knowles and Faster (1918)*

සිරිපාල මෝටර් රථයක් විකිණීම සඳහා දැක්වීමක් පළ කර ඇත්තේ 'මැස්ඩා 1200 මොඩලය' ලෙස විස්තර කරමිනි. තවද, මෝටර් රථයේ පිටුපස සවි කර තිබූ පුවරුවේ සඳහන් වූයේ 'මැස්ඩා 1200 මොඩලය' යනුවෙනි.

එකී විස්තරය මත පදනම්ව දුමින්ද විසින් මෝටර් රථය මිලදී ගෙන ඇත. එමනිසා විස්තරය සමග මෝටර් රථය අනුරූප නොවන බැවින් ඉහත ව්‍යංග කොන්දේසිය කඩකිරීමකට ලක්වී ඇත.

එමනිසා පීඩාවට පත්වූ පාර්ශ්වය වන දුමින්ද ගිවිසුම ප්‍රතික්ෂේප කිරීමකට හිමිකම් කියනු ලබන අතර අදාළ මෝටර් රථය විකිණීම සම්බන්ධයෙන් සිදු වූ අලාභ සිරිපාල යන අයගෙන් නැවත අය කරගත හැකිය.

*(ලකුණු 05)*

## 3 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

විනිමය බිල්පත් ආඥාපනතට අනුව, චෙක්පතක් යනු බැංකුකරුවෙකු වෙත අණ කෙරුණු, ඉල්ලූ විට ගෙවිය යුතු විනිමය බිල්පතකි.

ඉල්ලූ විට ගෙවිය යුතු නම්, එය සාධාරණ කාලයක් ඇතුළත අදාළ අණකරුට ලැබීමට සැලැස්විය යුතුය.

වඩා හොඳින් පවත්වාගෙන යනු ලබන බැංකු භාවිතයන්ට අනුකූලව, චෙක්පතක් ගෙවීමක් සඳහා ඉදිරිපත් කළ යුතු සාධාරණ කාලය වන්නේ චෙක්පතෙහි දින සිට මාස 06 ක කාලයකි.

එමනිසා එම මාස 06 ක කාලය අවසන් වීමෙන් පසුව චෙක්පතක් යල්පැනගිය චෙක්පතක් ලෙස බැංකුව විසින් හඳුනාගනු ලබන අතර අණකරු එවැනි චෙක්පතකට ගෙවීම් කිරීම ප්‍රතික්ෂේප කරනු ලබයි.

දී ඇති තත්ත්වයට අනුව, සුනිල්ට ලබාදුන් චෙක්පතෙහි දිනය ලෙස සඳහන් කර ඇත්තේ 2017 අප්‍රේල් 01 දිනයයි. නමුත් ඔහු චෙක්පත මුදල් කරගැනීමට බැංකුව වෙත ගිය දිනය 2017 දෙසැම්බර් 15 දිනයි. එමනිසා අදාළ මාස 06 ක කාලයක් අවසන් වීම නිසා සුනිල්ට එම චෙක්පත මුදල් කරගැනීමට හිමිකමක් නොමැත.

*(ලකුණු 05)*

## 4 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

මෙය පදනම් වන්නේ රක්ෂණ නීතිය මතය. මෙහිදී ඇලිස්ට තම සහෝදරියගේ ජීවිතය සම්බන්ධව කිසියම් වූ රක්ෂණ හිමිකමක් පවතී ද යන්න තීරණය කළ යුතුය.

ජීවිත රක්ෂණයක දී, තවත් පුද්ගලයෙකුගේ ජීවිත රක්ෂණාවරණයක් ලබාගැනීමට බලාපොරොත්තු වන තැනැත්තා, අදාළ ජීවිත රක්ෂණ ආවරණය ලබාගැනීමට යන තැනැත්තාගේ (රක්ෂිතයාගේ) මරණය නිසා ඔහු / ඇය මූල්‍යමය අලාභ භුක්ති විඳින බවට තහවුරු කළ යුතුය. එමගින් ඔහු හෝ ඇයට රක්ෂිතයාගේ ජීවිතය වෙනුවෙන් රක්ෂණ හිමිකමක් ඇත.

එමනිසා, සහෝදරයෙකුට තවත් සහෝදරයෙකු වෙනුවෙන් රක්ෂණ හිමිකමක් නොමැත.

*Evans Vs. Crooks (1911)*

එමනිසා, ඇලිස්ට තම සහෝදරියගේ ජීවිතය සම්බන්ධයෙන් රක්ෂණ හිමිකමක් නොමැත. එමනිසා තමාගේ සහෝදරියගේ ජීවිතය සඳහා ජීවිත රක්ෂණාවරණයක් ලබාගැනීමට ඇලිස් විසින් සීමාසහිත සේෆ් ලයිෆ් රක්ෂණ සමාගමට ඉදිරිපත් කළ අයදුම්පත පිළිගැනීමට හැකියාවක් නැත.

***(ලකුණු 05)***

## 5 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

**නෞභාර පත්‍රය**

නැවේ හිමිකරු විසින් භාණ්ඩ තොගය අපනයනකරුට එක් වරායක සිට තවත් වරායකට අදාළ භාණ්ඩ තොගය ප්‍රවාහනය කර දෙන බවට එකඟ වෙමින් නිකුත් කරන ලියවිල්ල නෞභාර පත්‍රය වේ.

නෞභාර පත්‍රයක ප්‍රධාන කාර්යයන් හතරකි.

I) නැව් කටයුතු කරන සමාගම මගින් නැව්ගත කළ භාණ්ඩ සඳහා කුවිතාන්සියක් ලෙස ක්‍රියා කරනු ලබයි. සාමාන්‍යයෙන් මෙහි භාණ්ඩවල ප්‍රමාණය සහ තත්ත්වය (ප්‍රමිතීන්) සඳහන් වේ.

II) නැව් සමාගම සහ අපනයනකරු අතර මුහුදින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ ගිවිසුමක් ඇති බවට සාක්ෂියක් ලෙස සාමාන්‍යයෙන් බිල්පත් නිකුත් කිරීමට පෙර පාර්ශවයන් අදාළ ගිවිසුමට එළඹෙනු ලබයි. එමනිසා නැව්ගත කරන්නා සහ භාණ්ඩ ගෙනයන්නා අතර ඇති ගිවිසුමක් පිළිබඳ සාක්ෂියක් ලෙස ද මෙය කටයුතු කරයි. ගිවිසුම සම්බන්ධ සියලු නියමයන් අදාළ පත්‍රිකාවේ පිටුපස සඳහන් කරයි.

III) නැව්ගත කළ භාණ්ඩවල හිමිකම පිළිබඳ ලියවිල්ලක් ලෙස කටයුතු කරයි. නෞභාර පත්‍රයේ මුල් පිටපත ඉදිරිපත් කිරීමෙන් පමණක් අදාළ ගමනාන්තයේ දී භාණ්ඩ නිදහස් කරයි.

IV) අපනයනය කළ භාණ්ඩවලට සිදුවන කිසියම් හානිවීමක දී ඒවාට රක්ෂණ වන්දි ලබාගැනීම ඉල්ලුම් කිරීමට යොදාගත හැකි ලියවිල්ලකි.

***(ලකුණු 05)***

## 6 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(බුද්ධිමය දේපළ වර්ග දෙකක් පැහැදිලි කිරීම ප්‍රමාණවත්ය.)

**(1)** පිටපත් අයිතිය:

පිටපත් අයිතිය යනු 'මුල් කෘති' වෙනුවෙන් නිර්මාණකරුවන්ට ලබා දී ඇති අයිතියයි. මෙහිදී 'නව්‍යතාවය' අතිශය වැදගත් වන අතර නව්‍යතාවය තිබිය යුත්තේ 'අදහස් ප්‍රකාශනයට' වේ. හුදු 'අදහස්' මේ යටතේ ආවරණය නොවේ. මුල් කෘතියකින් ව්‍යුත්පන්න වූවක් එනම්, පරිවර්තනයක් හෝ මුල් කෘති එකතුවක් වුව ද මේ යටතේ ආරක්ෂණය කෙරෙයි. මෙහිදී 'කෘතිය' යනු සාහිත්‍යමය, කලාව පිළිබඳ වූ හෝ විද්‍යාත්මක නිර්මාණ වේ.

උදා :- - සාහිත්‍යමය නිර්මාණ යනු ලිඛිත හෝ වාචික නිර්මාණ වන අතර නිදසුන් ලෙස ග්‍රන්ථ සහ කතාවන් දැක්විය හැකිය.

- වාස්තු විද්‍යාත්මක සහ ග්‍රැෆික් නිර්මාණ වැනි දේ කලාත්මක නිර්මාණ ගනයේ ලා සැලකිය හැකිය.
- විද්‍යාත්මක නිර්මාණ ලෙස රූපමය විචිත්‍රණයන් වන සිතියම්, සැලසුම් සහ රූපසටහන් දැක්විය හැකිය.

**(2)** ලකුණු :

ලකුණක් යනු එක් ව්‍යාපාරයක භාණ්ඩ හෝ සේවාවලින් තවත් ව්‍යාපාරයක භාණ්ඩ හෝ සේවා වෙන් කොට හඳුනාගත හැකි දෘෂ්‍ය ලකුණකි. එය, වචනයක්, ආදර්ශ පාඨයක්, නමක්, අක්ෂර සමූහයක්, සංකේතයක්, මෝස්තරයක්, පින්තූරයක්, උක්ත ඕනෑම සංයුතියක්, ශබ්දයක් හෝ භාණ්ඩ ඇසුරුම් ක්‍රමයක් විය හැකිය.

භාණ්ඩ විකිණීම, ආශ්‍රිතව වන ලකුණක් 'වෙළෙඳ ලකුණක්' ලෙසට ද සේවා සැපයීම ආශ්‍රිතව වන ලකුණක් 'සේවා ලකුණක්' ලෙස ද හඳුනා ගනියි.

**(3)** පේටන්ට්:

යම් නව නිර්මාණකරුවෙකුගේ නව නිර්මාණ තුළ,

- නව්‍යතාවය
- නව නිර්මාණකරණ පියවර
- කාර්මික අදාළත්වය යන අංග ඇතුළත් වේ නම් ඊට පේටන්ට් බලපත්‍රයක් ලබාගත හැක.

තාක්ෂණික ක්ෂේත්‍රයේ ඇති ගැටලුවක් සඳහා නව විසඳුමක් සොයා ගැනීම නව නිර්මාණකරණයේ දී සිදු වේ. එය නිෂ්පාදනයක් හෝ නිෂ්පාදන ක්‍රියාවලියක් විය හැකිය. පේටන්ට් අයිතිය ලබාදීම තුළ රජය විසින් නව නිර්මාණකරුවාට වසර 20 ක කාලයක් සඳහා නව නිර්මාණයට පරම අයිතියක් ලබාදෙයි.

ඒ හරහා අදාළ නිර්මාණය නිර්මාණකරුගේ අවසරයකින් තොරව, භාවිතයට, විකිණීමට, නිෂ්පාදනයට හෝ ප්‍රති නිර්මාණය කිරීමට අනෙක් පුද්ගලයන්ට නොහැකි වේ.

**(4)** වෙළෙඳ නාමඃ

යම් ස්වභාවික පුද්ගලයෙකුගේ හෝ නෛතික පුද්ගලයෙකුගේ ව්‍යාපාරයක් හැඳින්වීම සඳහා යොදාග නු ලබන නාමයක් ලෙස හඳුනාගත හැකිය. මහජන සදාචාරයට එරෙහි වන්නා වූ, ආගම් විවේචනය කරන්නා වූ, ජාතිවාදය අවුළුවන්නා වූ හෝ මහජනයා නොමග යවන්නා වූ වෙළෙඳ නාමයන් ලියාපදිංචි කළ නොහැක.

**(5)** කාර්මික සැලසුම්ඃ

කාර්මික සැලසුම් යනු යම් භාණ්ඩයක අලංකරණ හා සෞන්දර්යාත්මක ලක්ෂණ වේ. කාර්මික සැලසුම් සඳහා ආරක්ෂණය ලබාගත හැක්කේ එය 'අලුත්ම එකක්' නම් පමණි. ලියාපදිංචිය පිණිස අයදුම්පත ඉදිරිපත් කරන දිනය වන විට එය මහජනතාවට ප්‍රදර්ශනය වී හෝ ප්‍රවේශය සහිත වී නොතිබිය යුතුය.

**(6)** භූගෝලීය දර්ශකඃ

යම් භාණ්ඩයක ප්‍රභවය නිශ්චිත ප්‍රදේශයක දී සිදු වූ බවට හඳුනාගත හැකි දර්ශකයක් මෙමගින් අදහස් වේ. මෙහිදී යම් භාණ්ඩයක ඇති සුවිශේෂිත්වය එම භාණ්ඩය ප්‍රභවය ලද රට, කලාපය, ප්‍රදේශය වැනි භූගෝලීය සාධකයක් තුළින් ආරෝපණය වී ඇති විටෙක භූගෝලීය දර්ශකය ඇති වේ. මෙහිදී භාණ්ඩයේ ඇති විශේෂිත ගුණයක්, ලක්ෂණයක් කීර්තිනාමයක් එය නිර්මාණය වූ ප්‍රදේශයේ නම හෝ එහි සුවිශේෂී සලකුණක් සමග පටබැඳී තිබිය යුතුය.

නිදසුන් :- ශ්‍රී ලංකාවේ තේ, ස්විට්සර්ලන්තයේ චොකලට්

*(ලකුණු 05)*

**B කොටසෙහි අවසානය.**

අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 7 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

මෙය ගිවිසුම් නීතිය මත පදනම් වේ. අශේන් සහ සීමාසහිත ඔටෝමොබයිල් ලංකා (පෞද්ගලික) සමාගම අතර මෝටර් රථයක් කුලියට ගැනීමේ අදහස මත ගිවිසුමකට ඇතුළත් වීම සිදු වේ.

අශේන් සහ ඔටෝමොබයිල් ලංකා (පෞද්ගලික) සමාගම අතර ඇති වන ගිවිසුම නීත්‍යානුකූල ගිවිසුමකි. අශේන් මෝටර් රථය ඇණවුම් කරන අවස්ථාවේ දී ම ඔහුගේ අවශ්‍යතාවය විශේෂයෙන් ම පවසන ලදී. කෙසේ නමුත් ඔහු ඇණවුම් කරන ලද්දේ මගීන් 05 දෙනෙකුට ආසන පහසුකම් සහිත සංචාරය සඳහා සුදුසු සුවපහසු මෝටර් රථයකි. නමුත් සංචාරය දිනයේ දී ඔහුට ලැබුණේ මගීන් දෙදෙනෙකුට පමණක් ප්‍රමාණවත් ස්පෝර්ට්ස් වර්ගයේ මෝටර් රථයකි.

එමනිසා අශේන් සහ සමාගම අතර ගිවිසුමට පැමිණීමේදී ඇති කරගත් 'විශේෂ ප්‍රකාශන නියමයන්' සමාගම විසින් ගිවිසුම උල්ලංඝනය කර ඇත. මේ මත පදනම්ව අශේන්ට අදාළ ආයතනයෙන් ගිවිසුම කඩ කිරීම සම්බන්ධව ප්‍රතිකර්මයක් ලබාගැනීමට හිමිකමක් ඇත.

ඉහත දී ඇති දත්තයන්ට අනුව අශේන්ට ගිවිසුම උල්ලංඝනය කිරීමේ ප්‍රතිකර්මයක් ලෙස අදාළ ආයතනයෙන් හානි සඳහා වන්දි ඉල්ලා සිටිය හැකිය. ගිවිසුමේ අනෙක් පාර්ශ්වය විසින් ගිවිසුම කඩ කිරීමේ ප්‍රතිඵලයක් ලෙස හානියට පත් වූ පාර්ශ්වයට වූ හානි සඳහා හිලව් කිරීමක් ලෙස වන්දි ලබා දෙයි. තවද, මෙම හානි සඳහා වන්දි ලබාදීමෙන් අදහස් කරන්නේ අගතියට පත් පාර්ශ්වය අදාළ ගිවිසුම නිසි ආකාරයට සිදු වී තිබුණේ නම් එකී තත්ත්වයට ඔහුව පත් කිරීමයි.

කෙසේ වෙතත් හානිය සාධාරණ ලෙස ගණනය කිරීමට හැකියාවක් පවතින්නේ නම්, අධිකරණය විසින් වන්දි ප්‍රදානය කිරීමට ඉල්ලා සිටිය හැකිය.

ගිවිසුම කඩවීම නිසා අශේන්ට ඔහුගේ සම්පූර්ණ සංචාරය අවලංගු කිරීමට සිදුවුණි නම්, එය ඔහුගේ දෛනික ඉපැයුමට සෘජුවම බලපාන කරුණකි. එමනිසා ඔහුට අදාළ සමාගමට එරෙහිව නඩු පවරා වන්දි ලබාගැනීම සඳහා කටයුතු කළ හැකිය. ඒ සඳහා ඔහුට වන්දි මුදලට අදාළ නියමිත දින සිදු කිරීමට නියමිතව තිබූ සම්පූර්ණ සංචාරයේ වටිනාකම ද ඇතුළත් කළ හැකිය.

*(ලකුණු 10)*

## 8 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

සේවකයෙක් යනුවෙන් හඳුන්වන්නේ යම් සේවා ගිවිසුමක් මත සේවායෝජක විසින් සේවයේ යොදවා ඇති අයෙකි. යම් පුද්ගලයෙකු සේවායා විසින් සේවයෙහි යොදවා ඇති විටෙක, ඔහු සේවකයෙකු ම නොව, ඔහු නිදහස් ගිවිසුම්කරුවෙකු ලෙස ද හඳුන්වයි.

සුනිමල් සීමාසහිත සැම්රෝ සමාගමේ කෝකියෙකු ලෙස සේවය කරන්නෙකි. මෙහිදී ඔහු සේවකයෙකු ද නැතිනම් නිදහස් සේවක ගිවිසුම්කරුවෙකු ද යන්න නිශ්චිතව හඳුනාගත යුතුය.

එය නිවැරදිව නිශ්චය කරගැනීම සඳහා සේවකයෙකුගේ තත්ත්වය පරීක්ෂා කිරීමට පහත සඳහන් පරීක්ෂණ 04 කම්කරු පනතින් දක්වා ඇත. ඒවා නම්,

- පාලනය පිළිබඳ පරීක්ෂණය
- උපකරණ පිළිබඳ පරීක්ෂණය
- ඒකාබද්ධ පරීක්ෂණය
- ආර්ථික යථාර්ථය පිළිබඳ පරීක්ෂණය

**පාලනය පිළිබඳ පරීක්ෂණය**

සේවායෝජක විසින් සේවය කරන පාර්ශ්වය විසින් කිරීමට ඇති කාර්යයන් එනම්, සේවයට පැමිණෙන, පිටවන, උදෑසන, දහවල් ආහාර ගන්නා වේලාවන් ආදිය විනයානුකූලව පාලනය කරයි නම්, ඔහු සේවකයෙකි. මෙහිදී සුනිමල්ට උදයේ සහ රාත්‍රියේ නම්‍යශීලී සේවා කාලයක් තිබෙන අතර ඔහුට ගෙවීම් කරන ලද්දේ පැය ගණනටය. එමනිසා පාලනය පිළිබඳ පරීක්ෂණය යටතේ ඔහු සේවකයෙකු නොවේ.

**උපකරණ පිළිබඳ පරීක්ෂණය**

යම්කිසි පුද්ගලයෙකු අදාළ කාර්ය ඉටු කිරීමට අවශ්‍ය සියලු භාණ්ඩ ඔහු විසින් ම රැගෙන එයි නම් ඔහු නිදහස් සේවක ගිවිසුම්කරුවෙකු වේ. මෙම තත්ත්වයේ දී සුනිමල් ඔහුට අයත්ව ඇති උපකරණ සේවයට පැමිණෙන විට රැගෙන එන අතර, ඒවා නැවත රැගෙන යාම ද සිදු කරයි. එමනිසා ඔහු සේවකයෙකු නොවේ.

ඉහත කරුණු මත පදනම්ව සුනිමල් යනු නිදහස් සේවක ගිවිසුම්කරුවෙකි.

*(ලකුණු 10)*

## 9 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a) කමල් විසින් බිමල් සමග ඇති ඔහුගේ ව්‍යාපාරයේ සබඳතා භාවිත කරමින් ඒ හා සමාන ස්වභාවයේ ව්‍යාපාරයක් තම බිරිඳ සමග එක්වී ආරම්භ කර ඇත. හවුල් ව්‍යාපාර ආඥා පනතට අනුව, සෑම හවුල්කරුවෙකුටම අනෙක් හවුල්කරුවන්ගේ අනුදැනුමකින් තොරව එක හා සමාන තරගකාරී ව්‍යාපාරයක හවුල්කරුවෙකු ලෙස කටයුතු කිරීම නොකළ යුතු කටයුත්තක් බව දක්වා ඇත. ඔහු එසේ කළේ නම්, ඔහු විසින් එම එදිරිවාදී ව්‍යාපාරවලින් ඉපැයූ සියලු ලාභ අදාළ හවුල් ව්‍යාපාරයට ගෙවිය යුතුය. (අනෙක් හවුල්කරුවාට ගෙවිය යුතුය.)

***Pillans Brothers Vs. Pillaws***

එමනිසා, කමල් තම බිරිඳ සමග එක්ව ඇරඹූ නව ව්‍යාපාරයේ සියලු ලාභය බිමල් සමග ඇති කරගත් හවුල් ව්‍යාපාරයට ලබාදිය යුතුය.

***(ලකුණු 06)***

(b)

**හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් සහ වගකීම්**

හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් හා වගකීම් හවුල් ව්‍යාපාර ගිවිසුම මගින් තීරණය කරනු ලැබේ. හවුල් ගිවිසුමක් ලිඛිතව හා වාචිකව ඇති කරගත හැකිය. යම් හවුල් ගිවිසුමක් එහි හවුල්කරුවන්ට සුවිශේෂී අයිතීන් ලබා නොදෙන්නේ නම්, හවුල් ව්‍යාපාර පනතේ 24 වන වගන්තිය යටතේ අයිතීන් හා වගකීම් තීරණය කළ හැකිය. හවුල් ව්‍යාපාර පනතට අනුව අයිතීන් හා වගකීම් පහත ආකාරයට තීරණය කළ යුතුය.

1. **ප්‍රාග්ධනය හා ලාභය**

   හවුල්කරුවන් විසින් සමාන ප්‍රාග්ධනයක් දායක කරනු ලබන අතර ලාභාංශද සමානව බෙදාගනු ලැබිය යුතුය.

2. **වන්දි ගෙවීම**

   කරනු ලබන ගෙවීම් සම්බන්ධයෙන් සහ ඔහු විසින් දරනු ලබන පුද්ගලික වගකීම් සම්බන්ධයෙන් සමාගම විසින් සෑම හවුල්කරුවකුට හානිපූරණය කරනු ලැබිය යුතු වේ.

   (අ) ව්‍යාපාර ආයතනයේ ව්‍යාපාර කටයුතු සාමාන්‍ය පරිදි සහ නිසියාකාරව කරගෙන යාමේදීය.

   (ආ) ව්‍යාපාර ආයතනයේ ව්‍යාපාර හෝ දේපළවල ආරක්ෂණය වෙනුවෙන්

3. **ණය සඳහා පොලී**

   හවුල් ව්‍යාපාරය සඳහා යම් හවුල්කරුවකු විසින් ණය මුදලක් ලබාදෙන විට, ඔහුට වර්ෂයකට 5% ක පොලියක් ලබාගැනීම සඳහා හිමිකම් ලැබේ.

4. **ප්‍රාග්ධනය සඳහා පොලී**

   කිසිම හවුල්කරුවකු විසින් ප්‍රාග්ධනය මත පොලී මුදල් ලබාගැනීම සඳහා හිමිකම් නොලබන නමුත් ගිවිසුමේ අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා තිබිය හැකිවේ.

5. **හවුල් ව්‍යාපාරයේ කළමනාකරණය**

   සෑම හවුල්කරුවකුට කළමනාකරණ කටයුතුවල යෙදී සිටිය යුතු නමුත් ඒ සඳහා වැටුප් ලබා ගැනීමට හිමිකම් නොලබයි.

6. **නම හවුල්කරුවෙකු හඳුන්වා දීම**

සියලු හවුල්කරුවන්ගේ කැමැත්ත නොමැතිව කිසිදු අලුත් හවුල්කරුවකු ඇතුළත් කරගනු නොලැබිය යුතු වේ.

7. **සාමාන්‍ය කරුණුවල වෙනස්කම්**

සාමාන්‍ය කරුණු බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු වේ. සමාන ඡන්ද ප්‍රමාණයක් ඇති අවස්ථාවකදී, අලුත් වෙනස්කම් සිදුකළ නොහැකි වේ. එසේ වුවද, සියලු හවුල්කරුවන්ගේ කැමැත්ත නොමැතිව ව්‍යාපාරයේ ස්වභාවය වෙනස්කළ නොහැකි වේ.

8. **හවුල් ව්‍යාපාර පොත්**

හවුල් ව්‍යාපාර පොත් ව්‍යාපාරික ස්ථානයේ තැබිය යුතු වේ.

9. **නෙරපීම**

ගිවිසුමේ විධිවිධාන සලස්වා ඇත්නම් මිස, යම් හවුල්කරුවකු නෙරපීම සඳහා සියලු හවුල්කරුවන් එකඟ විය යුතු වේ. (ගිවිසුමේ එවැනි වගන්තියක් ඇත්නම්, එය සද්භාවයෙන් සංස්ථාගත කර තිබිය යුතු වේ.)

<u>හවුල්කරුවන්ගේ වගකීම්</u>

**01. සත්‍ය ගිණුම් සහ සම්පූර්ණ තොරතුරු සැපයීමේ වගකීම**

සියලු හවුල්කරුවන් විසින් සත්‍ය ගිණුම් සහ වෙනත් අය සමග වූ ස්වකීය ගනුදෙනුවලට අදාළ සම්පූර්ණ තොරතුරු අනෙකුත් හවුල්කරුවන්ට ඉදිරිපත් කළ යුතු වේ.

**02. පෞද්ගලික ලාභවලට වගවීම**

සෑම හවුල්කරුවෙකුම ඔහුට පහත ආකාරවලින් ලැබෙන සියලු වරප්‍රසාද පිළිබඳ සම්පූර්ණ තොරතුරු අනාවරණය කළ යුතුය.

(අ) ව්‍යාපාර ආයතනයට අදාළ ඕනෑම ගනුදෙනුවකින්,

(ආ) ඔහු විසින් භාවිත කළ හවුල් ව්‍යාපාරයේ ඕනෑම දේපළකින්

(ඇ) නම සහ ව්‍යාපාර සම්බන්ධතා මගින්

**03. ව්‍යාපාර ආයතනය සමග තරග නොකිරීම**

පනතේ 30 වන වගන්තියේ සඳහන් ආකාරයට, අනෙක් හවුල්කරුවන්ගේ කැමැත්ත නොමැතිව සමාන ස්වභාවයේ සහ සමාගම සමග තරඟකාරීවන ව්‍යාපාරයක් පවත්වාගෙන යෑම මගින් සෑම හවුල්කරුවකුම විසින් හවුල් ව්‍යාපාරය සමග තරඟ නොකිරීම සෑම හවුල්කරුවකුගේම වගකීමක් වේ. ඔහු විසින් එසේ සිදුකරයි නම්, ඔහු එම ව්‍යාපාරයෙන් උපයනු ලබන සියලු ලාභ ආයතනය වෙත ගෙවිය යුතු වේ.

*(ලකුණු 04)*

*(මුළු ලකුණු 10)*

**C කොටසෙහි අවසානය.**

අනිවාර්ය ප්‍රශ්නයකි.
(මුළු ලකුණු 25)

## 10 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

**(a)**

(i) ගිවිසුම් නීතිය අනුව, කුමාර් සහ සීයා අතර ඇති වී තිබෙන්නේ ගෘහස්ථ එකඟතාවයකි.

ගෘහස්ථ එකඟතා ඇති කරගත හැක්කේ යහළු මිත්‍රයින්, පවුලේ සාමාජිකයින්, නෑදෑයන් අතර වේ. පාර්ශ්වයන්ට නෛතික වශයෙන් බැඳීමට ලක්වන එකඟතාවයක් නිර්මාණය කරගැනීමේ චේතනාවක් නොමැති නම්, එය ගෘහස්ථ එකඟතාවයක් ලෙස පූර්ව නිගමනය කරයි.

දී ඇති තත්ත්වයේ දී සීයාගේ ප්‍රතිචාරය වන්නේ 'එය හුදෙක් ඔබව ධෛර්යමත් කිරීමක් පමණක් බවත්, ඔබ ඇත්තෙන්ම සිතනවාද මම ඔබට BMW කාර් එකක් අරන් දෙයි කියා'ය. මෙහිදී සීයා විසින් නෛතික බැඳීමකට එකඟවීමේ චේතනාවක් නොතිබුණි.

***Balfour vs. Balfour***

එමනිසා, කුමාර්ට තම සීයාගෙන් BMW කාර් රථයක් ලැබීමට හිමිකමක් නැත.

***(ලකුණු 07)***

(ii) දී ඇති තත්ත්වයට අනුව, ගිවිසුම ඇති කරගෙන ඇත්තේ බාලවයස්කරුවෙකු සමගිනි. ගිවිසුම් නීතියට අනුව බාලවයස්කරුවන් සමග ඇති කරගන්නා ගිවිසුම්වල නෛතිකභාවයක් නොමැත. ඊට හේතුව වන්නේ ඔවුන්ගේ ගිවිසුම් පිළිබඳ දැනීම හා ගිවිසුම්ගත වීමේ ධාරිතාවක් නැති වීමයි.

අවුරුදු 18 ට අඩු සෑම කෙනෙක්ම බාලවයස්කරුවෙකු ලෙස හඳුන්වනු ලබන අතර බාලවයස්කරුවන් සමග ඇති කරගන්නා බොහෝ ගිවිසුම් ඔවුන්ගේ අවසරය මත බලරහිත වේ. එමනිසා, බැඳීමට ලක් නොවී සිටීමට අයිතියක් ඇති බව පැහැදිලිය.

රවී, නැන්දනිය සමග ගිවිසුමකට එළඹෙන්නේ වයස අවුරුදු 13 දීය. එම අවස්ථාවේ දී ගිවිසුමක් සම්බන්ධව ඔහුට ඇති දැනුම අවම බැවින් එය බලරහිත වේ.

විකල්ප උත්තරය

තවදුරටත් අදාළ ගිවිසුම යටතේ රවී ප්‍රතිලාභ ලබන බැවින් සහ 'සුබසාධන සේවා ගිවිසුම' යටතේ ඔහු තම පළමු වසරේ වැටුප නැන්දනියට ගෙවිය යුතු බවට තර්ක කළ හැකිය.

***AG Vs. Costa***

***(ලකුණු 07)***

b)

(i) 'නියෝජ්‍යාත්ව නීතිය' ට අනුව දී ඇති තත්ත්වයේ දී **සිරි** ප්‍රධානියා ලෙස ද **පාල** නියෝජිතයා ලෙස ද කටයුතු කරයි.

සිරි විසින් ප්‍රකාශිතව නියෝජ්‍යාත්වය පැන නැගීම යටතේ, නියෝජ්‍යාත්වය ලිපියක් මගින් පාලට දන්වා ඇත.

නියෝජ්‍යාත්ව නීතියට අනුව නියෝජිතයා තම ප්‍රධානියා විසින් ලබා දී ඇති උපදෙස් අනුගමනය කිරීමට වගකීමකට බැඳී ඇත. තවද, ඔහු ඔහුට දුන් බලතල ඉක්මවා කටයුතු නොකළ යුතුය.

නියෝජිතයෙකු ලෙස ඔහු විසින් රහස්‍ය ලාභ නොඉපයිය යුතුය. මෙම තත්ත්වයේ දී **පාල** කුඩා ගොවිපොළක් අරඹමින් මසකට රු. 100,000 ක මුදලක් ද උපයා ඇත. එමනිසා රහස්‍ය ලාභ ලැබීමෙන් ඔහු තම වගකීම් උල්ලංඝනය කර ඇත.

එමනිසා **පාල** නියෝජිතයෙකු ලෙස ඔහුගේ මූලික වගකීම් උල්ලංඝනය කර ඇත.

***(ලකුණු 05)***

(ii) නියෝජ්‍යාත්ව නීතියට අනුව, නියෝජිතයා විසින් ප්‍රධානියා ලබා දුන් උපදෙස් අනුගමනය කළ යුතුය.

මෙම තත්ත්වයේ දී, **සිරි** විසින් **පාල**ට කිසිදු දෙයක් ණයට ලබාගැනීම ප්‍රකාශිතව තහනම් කළේය. නමුත් එම තහනම නොතකා **පාල** විසින් **පෙරේරාගෙන්** යම් යම් දෑ ණයට ලබාගන්නා ලදී. **සිරි**ගේ නියෝජිතයෙකු නිසා ඔහුට කිසිදු දෙයක් ණයට මිලදී ගැනීමට අධිකාරිත්වයක් නොමැත.

මේ මත පදනම්ව, **පෙරේරා**ට **සිරි** යන අයගෙන් අදාළ ණය මුදල පියවා ගැනීමට හැකියාවක් ඇත.

අදාළ මුදල නැවත අය කරගැනීම සම්බන්ධව **පාල**ට එරෙහිව **සිරි**ට ක්‍රියාමාර්ග ගත හැකිය. **පාල** අදාළ මුදල **සිරි**ට පියවීමට බැඳී සිටී.

***(ලකුණු 06)***

***(මුළු ලකුණු 25)***

**C කොටසෙහි අවසානය.**

## *Notice :*

These answers complied and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers".

The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

*© 2017 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*
*All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*